යම් පුවතකට සෘජුවම අදාළ නොවන්නේ නම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ වාර්ගිකත්වය පුවත සමගින් සඳහන් නොකළ යුතු බව ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ජනමාධ්‍ය සඳහා ඉදිරිපත් කර ඇති වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ සඳහන් වේ.

ජූනි 2 දින "පන්සලේ T-56 දෙකක් තියාගෙන හිටි ඌවතැන්නේ සුමන හිමි ජීවිතාන්තය තෙක් හිරේට" යන සිරස්තලය සමගින් පළ වී ඇති මව්බිම පුවත තුළ, "...දෙමළ ජාතිකයින් තිදෙනෙකු ඇතුළු සිවුදෙනෙකුද මෙම සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන තිබුණු..." බව දැක්වේ. එසේම තවදුරටත් එම සැකපිට අත්අඩංගුවට ගත් සිවුදෙනා නඩුව විභාගයට ගත් අතරතුරදී අධිකරණය මගින් නිදොස් කොට නිදහස් කෙරී තිබූ බවද සඳහන් වේ.

කෙසේ වෙතත් මෙම පුවත වාර්තා කර තිබූ ජූනි 01 ස්වර්ණවාහිනී පුවත් සහ, ජූනි 02 දිවයින, ද අයිලන්ඩ්, ඩේලි මිරර් හා ඩේලි එෆ්ටී ද ජූනි 03 දිනමිණ පුවත් වාර්තාවන් තුළද විශේෂයෙන් කිසිදු අයෙකුගේ වාර්ගිකත්වයක් සඳහන් නොවුණි.

මෙම පුවත් වාර්තාව සමගින් පාඨක අපට නැගෙනා පැනයන් මේවායි. සිවුදෙනෙකු සැකපිට අත්අඩංගුවට ගත් බව වාර්තා වූවත්, එයින් තිදෙනෙකුගේ පමණක් වාර්ගිකත්වය විශේෂයෙන් සඳහන් කිරීමට මව්බිම පුවත්පතට අවශ්‍ය වූයේ මන්ද? විශේෂයෙන්ම නිදොස් කොට නිදහස් කෙරී ඇති එම සැකකරුවන් තිදෙනාගේ වාර්ගිකත්වය පුවතට සෘජුවම අදාළ වන්නේ කෙසේද? එසේ අදාළ නොවේ නම් මෙය ජනමාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima